චක්‍රලේඛ අංකය: 11/2002

මගේ අංකය: එම්/4
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 280, කෙලිත් විදිය,
කොළඹ 07.
2003.10.15 වැනි දින.

සියළුම විවාහ, උප්පැන්න හා
මරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## බාලවයස්කරුවන්ගේ විවාහ ලියාපදිංචි කිරීම

1995 අංක 18 දරණ පණතින් සංශෝධිත විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පණතේ 15 වගන්තිය අනුව විවාහ විය හැකි අවම වයස අවුරුදු 18 ලෙස සංශෝධනය කර ඇත. ඒ අනුව වයස අවුරුදු 18 ට අඩු ස්ත්‍රී පුරුෂ කිසිවකුට විවාහ වීමට නීතියෙන් ඉඩකඩ නොමැත.

02. මෙසේ වුවද සමහර විවාහ රෙජිස්ට්‍රාර්වරුන් විසින් වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන්ගේ විවාහ ලියාපදිංචි කරන බවට මා වෙත පැමිණිලි ලැබී තිබේ. මෙසේ බාලවයස්කරුවන්ගේ විවාහ ලියාපදිංචි කිරීමේ හේතුවෙන් මෑතකදී විවාහ රෙජිස්ට්‍රාර්වරුන් කිහිප දෙනෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවී ඇත. විවාහ රෙජිස්ට්‍රාර් තනතුරේ ගෞරවනීය භාවයට මේ නිසා හානි සිදුවන්වා පමණක් නොව, ඒ මඟින් දෙපාර්තමේන්තුවද අපකීර්තියට පත්වේ.

03. මේ නිසා විවාහ ලියාපදිංචි කිරීමේදී රෙජිස්ට්‍රාර්වරුන් පාර්ශවකරුවන්ගේ වයස පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු බව දන්වමි. වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ කිසිම පුද්ගලයකුගේ විවාහයක් ලියාපදිංචි කිරීමෙන් වැලකී සිටිය යුතු බව අවධාරණය කරමි. පාර්ශවකරුවන්ගේ වයස පිළිබඳව සැකසහිත තත්වයක් ඇති වන්නේ නම්, ඔවුන්ගේ හැඳුනුම්පත් හෝ උප්පැන්න සහතික වැනි පිළිගත හැකි සාක්ෂියක් මඟින් වයස තහවුරු කරගත යුතු බවද දන්වමි.

04. වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින්ගේ විවාහ ලියාපදිංචි කිරීම් පිළිබඳව මා වෙත පැමිණිලි ලැබුනහොත්, අදාල රෙජිස්ට්‍රාර්වරුන්ට විරුද්ධව ඉතා තදබල ක්‍රියා මාර්ගයක් ගැනීමට සිදුවන බවද කාරුණිකව දන්වමි.

05. මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය – දැනගැනීම පිණිස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්.
3. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්.
4. ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්.
5. ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්.
6. දීප ව්‍යාප්ත උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් සංගමය.

රෝ/01